# දෙවන ලෝක යුද්ධය ආරම්භයේ සිට වසර හැත්තෑවක්

**Seventy years since the beginning of World War II**

2009 සැප්තැම්බර් 3

මිලියන හැත්තෑවකට වැඩි ජනතාවකට මරු කැඳවීමට හේතු වූ සිදුවීම් දාමයකට මුල පුරමින් අදින් වසර හැත්තෑවකට ඉහත දී දෙවන ලෝක යුද්ධය පුපුරා ගියේය. ඊලඟ වසර හය තුල හිතාගත නොහැකි පරිමානයක ම්ලේච්ඡත්වය පිපිරී ගිය යුද්ධය විසින් විදහා දැක්විනි. රුසියානු පෙරමුනේ බියකරු පරාජය, තෝකියෝ සහ ඩ්‍රෙස්ඩෙන් වෙත අග්නි බෝම්බ හෙලීම, මිලියන හයක යුරෝපියානු යුදෙව් ජාතිකයන් සමූල ඝාතනය කිරීම සහ හිරෝෂිමා හා නාගසාකි නගර මත පරමානු බෝම්බ හෙලීම මෙම ම්ලේච්ඡත්වය ක්ෂනිකව සිහිපත් කරවන සිදුවීම් සමහරකි.

යුද්ධයේදී ප්‍රථම ගොදුර වන්නේ සත්‍යයැයි සාමන්‍ය කියමනක් පවතී. දශක හතක් ගතවීත් මහජන මතයේ සකල නිල මාධ්‍ය රොත්තම යුද්ධයේ සැබෑ මූලයන් සහ එහි පාඩම් වලලා දැමීමට දිවා රෑ නොබලා තවමත් වැඩ කරමින් සිටිති.

පැතිර පවත්නා මිත්‍යාවන්ට ප්‍රතිපක්ෂව, පලමුවන ලෝක යුද්ධය "සියලුම යුද්ධයන්ගේ අවසන් යුද්ධයක්" නුවූ අයුරින්ම, මෙය ෆැසිස්ට්වාදයට එරෙහි ප්‍රජාතන්ත්‍රවාදයේ යුද්ධයක් ද නොවීය. එය ෆැසිස්ට්වාදී මෙන්ම 'ප්‍රජාතන්ත්‍රවාදී' ධනේශ්වර මහා බලවතුන් ලෝකය සහ එහි සම්පත් තම ලාභ අවශ්‍යතාවන් උදෙසා බෙදා ගැනීමට දියත් කල අධිරාජ්‍යවාදී යුද්ධයක් විය.

පලමු ලෝක යුද්ධය පිපිරීමෙන් අනතුරුව, ලෙනින් විසින් අනතුරු අඟවා සිටියේ, කම්කරු පන්තිය සමාජවාදී විප්ලවයකින් ධනේශ්වර ක්‍රමය පෙරලා නොදමන්නේ නම් තව තවත් යුද්ධයන් අනිවාර්යයෙන්ම එලැඹීමට නියමිත බවය. අධිරාජ්‍යවාදී බලවතුන් අතර මොනයම්ම හෝ 'සාමයක්' ඊලඟ ගැටුම පිපිරී යාමට පෙර හුදු අන්තර් කාලයක් පමනකියි ඔහු අවධාරනය කලේය. එම අනතුරු ඇඟවීම දැන් සනාථ වී තිබේ.

යුද්ධයේ ආසන්නතම හේතුව වූයේ 1939 සැප්තම්බර් 1 වෙනි දින නාසීන් විසින් පෝලන්තය ආක්‍රමනය කිරීමය. මීට පෙර වසරේ කුප්‍රකට මියුනිච් සමුලුවේදී අගමැති නෙවිල් චැම්බර්ලේන්ගේ බ්‍රිතාන්‍ය ආන්ඩුව විසින් චෙකොස්ලෝවෙකියාව පිලිබඳ ජර්මන් ඉල්ලීම් පිලිගෙන තිබුනි. ජර්මනියේ ව්‍යාප්තිය මධ්‍යම යුරෝපයට සීමා කල හැකියැයි යන සිතුවිල්ලෙන් චැම්බර්ලේන් 'අපගේ කාලයේ සාමය' උදා කර ගත් බව පවසමින් මියුනිච් සිට ආපසු ආවේය. හරියටම එයින් මාස එකොලහකට පසුව ඔහු යුද්ධ ප්‍රකාශ කලේය.

ජර්මනිය විසින් පෝලන්තය ආක්‍රමනය කිරීම හුදෙක්ම යුරෝපයේ තමන්ගේ තත්ත්වය ඉහල නංවා ගැනීමට අරමුනු කරන ලද්දක් නොව, ලෝක බලවතෙකු වීමේ අරමුනින් යුතුව කෙරුනක් බව පැහැදිලි විය. ඉන්දියානු උප මහද්වීපයේ මෙන්ම අප්‍රිකාවේ විශාල ප්‍රදේශයක් පාලනය කරමින් ලෝකයේ සෑම දෙසකින් ම අමුද්‍රව්‍ය සහ මූල්‍යමය ප්‍රභවයන් ඇද ගනිමින් වැජඹුන බ්‍රිතාන්‍යයට මෙම තත්ත්වය ඉවසා සිටීමට නොහැකි වීය.

යුද්ධය පුපුරා යාමට වසරකට පෙරාතුව හතරවන ජාත්‍යන්තරය ස්ථාපිත කලේය. නව ජාත්‍යන්තරය සඳහන් කල අයුරින් "මානව වර්ගයාගේ සමස්ත සංස්කෘතියටම තර්ජනය

එල්ල කරන ව්‍යසනයකින්" ගැලවීගැනීමට කම්කරු පන්තියේ නායකත්වය පිලිබඳ අර්බුදය විසඳීමේ හා සමාජවාදී විප්ලවය සූදානම් කිරීමේ තර්තව්‍යය එය භාර ගත්තේය.

කම්කරු පන්තියේ ද්‍රෝහී නායකත්වයන් වූ සමාජ ප්‍රජාතාන්ත්‍රික සහ ස්ටැලින්වාදී කොමියුනිස්ට් පක්ෂ යුද්ධයේ වෙඩි නූල දැල්වීමේ සෘජු වගකීම භාර ගත යුතුය. 1936 දී පුපුරා ගිය ස්පාඤ්ඤ විප්ලවය ජයග්‍රාහී වූයේ නම්, එය ජර්මනිය තුල බලගතුයැයි පෙනීමට තිබූ නාසි පාලනයට පවා තර්ජනය කරමින් යුරෝපය පුරා විප්ලවවාදී අරගලයන්ගේ පුනර්ජීවනයකට මඟ පෑදීමේ හැකියාවක් පැවතුනි.

එලෙසම, 1936 ප්‍රන්ස මහා වැඩ වර්ජනය දේශපාලන බලය කරා වන සෘජු අරගලයකට ගියේ නම්, එය බලවේගයන්ගේ සමතුලිතතාව තීරනාත්මකව වෙනස් කල හැකිව පැවතුනි. එහෙත් ස්ටැලින්වාදී සහ සමාජ ප්‍රජාතාන්ත්‍රවාදී නායකත්වයන් විසින් මෙම විප්ලවවාදී ව්‍යාපාරයන් දෙකෙහි ම ගෙල සිරකර දමනු ලැබූහ.

අනතුරුව, ට්‍රොට්ස්කි පැහැදිලි කල අයුරින්, ධනපති පන්තිය "තමන්ගේ අභිමතයට අනුව හැසිරවිය හැකි 'කම්කරු නායකයින්' සිටින බව ඒත්තු ගත් අතර ඕනෑම අයුරකින්, මහජනයා නව සමූල ඝාතනයකට ලක් කරමින් පවා එයට ඉදිරියට ගමන් කල හැකි බව තේරුම් ගත්තේය.

ජර්මන් හමුදාවන් විසින් ප්‍රන්සය ආක්‍රමනය කරන අතරවාරයේ 1940 මැයි මාසයේදී නිකුත් කල ප්‍රකාශනයකින් හිට්ලර් සහ ඔහු විසින් මෙහෙයවන ලද ෆැසිස්ට්වාදී ව්‍යාපාරයේ අත්‍යවශ්‍ය සාමජයීය අර්ථභාරය හතරවන ජාත්‍යන්තරය විසින් පැහැදිලි කෙරිනි.

"ඒ දිනවල බොල්ශෙවික්වාදයට එරෙහි වූ විමුක්තිකාමියෙකු ලෙස හිට්ලර් හුවා දැක් වූ ප්‍රජාතන්ත්‍රවාදී ආන්ඩු, දැන් ඔහු හඳුන්වන්නේ, ශුද්ධ වූ ගිවිසුම්, දේශ සීමා, නීති හා රෙගුලාසි උල්ලංඝනය කරන, නිරයේ පතුලෙන් අනපේක්ෂිත ලෙස නැගී ආ කිසියම් වර්ගයක යක්ෂයෙකු ලෙසය. හිට්ලර් නොවී නම් ධනවාදී ලෝකය උද්‍යානයක් සේ මලින් පිරී යාමට ඉඩ තිබුනාක් මෙනි. කොතරම් කාලකන්නි පවයක්ද? සිය හිස් කබල තුල ගනක යන්ත්‍රයක් ද, දෑතෙහි අසීමිත බලයක් ද, සහිතව ජර්මන් ජාතික මේ අපස්මාරකාරයා අහසින් කඩා වැටුනේ හෝ නිරයෙන් නැගී ආවේ හෝ නොවේ. මොහු වනාහි අනෙකෙක් නොව අධිරාජ්‍යවාදයේ සකල විනාශකාරී බලවේගයන්ගේ පුද්ගලාරෝපනයයි. දුර්වල ගැමි ජනයාහට ගැන්ගිස් කාන් සහ ටැමර්ලේන් (යථාවශයෙන් නම් ඔවුන් ප්‍රදර්ශනය කලේ තෘන භූමීන් සඳහා වන සියලුම ගෝත්‍රයන්ගේ ඉහල යන අවශ්‍යතාවය හා ජනාවාස ප්‍රදේශ කොල්ලකෑමේ අවශ්‍යතාවයයි) දෙවියන්ගේ විනාශකාරී කටුසැමිටිය ලෙස පෙනී ගිය පරිදිම, හිට්ලර් ද නියෝජනය කලේ අන්කිසිවක් නොව, පැරනි යටත්විජිත හිමි බලවතුන් එහි පතුලටම තල්ලු කර යවමින් බලයට ඒමේ අධිරාජ්‍යවාදී අවශ්‍යතාවට වඩාත් සාධිත ප්‍රකාශනයක් ලබා දීමයි."

යුද්ධය ඇරඹුනේ යුරෝපියානු ගැටුමක් ලෙස වුවත් ඉක්මනින්ම සමස්ත ලෝක ගෝලය පුරා ව්‍යාප්ත විය. දහනවවන ශත වර්ශයේදී, පලල්වන ලෝක වෙලඳපොලක පදනම මත ධනවාදී බලවතුන් එකිනෙකා සමග තරග කරන්නට වූහ. එහෙත් මහා අවපාතය හා ලෝක වෙලඳ පොලේ හැකිලී යාම මගින් ගෝලීය ආර්ථිකය ප්‍රතිමල්ල කඳවුරු වෙතට බෙදී ගිය අයුරු දැක ගැනීමට හැකිවිය.

තමන්ගේ අපනයන වෙලඳ පොලවල් බිඳ වැටීමට මුහුන දී සිටි ජපානය, චීනය තම යටතට ගැනීමෙන් හා නැගෙනහිර අධිරාජ්‍යයක් පිහිටුවා ගැනීමෙන් එහි අර්බුදය යටපත් කිරීමට මං සෙවීය. එහෙත් ෆැසිපික් කලාපයට තමන්ගේ බලය ව්‍යාප්ත කිරීමට තැත් දරමින් සිටි ඇමරිකා එක්සත් ජනපදයට මෙය ඉවසිය නොහැකි විය. ඒ අනුව යුද්ධය අනිවාර්ය විය. 1941 දෙසැම්බර් මාසයේදී ජපනුන් පර්ල් වරායට බෝම්බ හෙලීම පහසුවෙන්ම පූර්ව දශකය පුරා සූදානම් කරමින් පැවති යුද්ධයක් සඳහා කොකා ගැස්සීමක් විය.

ජර්මන් අධිරාජ්‍යවාදය සම්බන්ධයෙන් ගත් කල ප්‍රමුඛතම අධිරාජ්‍යවාදී බලය වන එක්සත් ජනපදයට අභියෝග කිරීම සඳහා එහි ධාරිතාවය වර්ධනය කිරීමට නම් මධ්‍යම සහ ගිනිකොන දිග යුරෝපයේ සම්පත් ප්‍රමානවත් නො වී ය. 1941 ජූනි 22 වෙනි දා සෝවියට් සංගමය ආක්‍රමනය කිරීමේ එල්ලය වූයේ ලෝක බලවතෙක් වශයෙන් තම ස්ථානය ස්ථාවර කරගැනීමට හැකිවනු ඇති ජර්මන් අධිරාජ්‍යයක් උදෙසා ආර්ථික පදනම ස්ථාපිත කර ගැනීම ය.

එක්සත් ජනපදයට තමන්ගේ බලයට නැග ගැනීමේ පදනම වූයේ ඇමරිකා මහද්වීපයේ දැවන්ත සම්පත්වල පදනමය. එහෙත් එයට එකී පදනම් මත දීර්ඝ කාලයක් සිට ගෙන සිටීමේ හැකියාවක් නොවී ය. එහි ආර්ථිකය වෙත ඒ සා දරුනු ලෙස ප්‍රහාර එල්ල කල මහා අවපාතයේ පාඩම වන්නේ එයයි. ඇමරිකානු ලාභ සුරක්ෂිත කරගත හැකිවන අයුරින් ලෝක වෙලඳ පොලවල් ඇමරිකානු අපනයන්ට ද ඇමරිකානු ආයෝජනයන්ට සහ ඇමරිකානු තාක්ෂනයට ද විවෘත කල යුතු විය. මෙම විධික්‍රමය, තමන් වෙනුවෙන් අධිරාජ්‍යයන් සකසා ගැනීමේ ජර්මනිය සහ ජපානය යන දෙරටේ පරිශ්‍රමයන් සමග මෙන්ම දැනටමත් ස්ථාපිත අධිරාජ්‍යය වන බ්‍රිතාන්‍ය සමග ද එකිනෙකට නොපෑහෙන්නක් විය. සියල්ලෝම ඇමරිකානු "දොර විවර කරනු" වැඩ සටහනට ඉඩ දිය යුතුය.

තම ආර්ථික ධාරිතාවය සහ වියැකී සිටි ප්‍රතිවාදීන් මත එය භුක්ති විඳිමින් සිටි අධිකාරීත්වයේ පදනම මත, දෙවන ලෝක යුද්ධාවසානයේදී ලෝක ධනපති පද්ධතිය ස්ථාවර කිරීමට එක්සත් ජනපදයට හැකියාව ලැබුනේය. අනතුරුව එලඹුනු පශ්චාත්-යුද උත්පාතය සහ සෝවියට් සංගමය සමඟ සීතල යුද්ධය, හරියටම දශක තුනක කාල පරාසයක දී ලෝක යුද්ධයක් ලෙස දෙවතාවක් පුපුරා ගිය අන්තර්-අධිරාජ්‍යවාදී පසමිතුරුතාවන් හසුරුවා ගැනීම සඳහා රාමුව සම්පාදනය කරනු ලැබීය.

අද මෙම සමතුලිතතාවේ පදනම් තවදුරටත් නො පවතියි. මහා අවපාතයෙන් අනතුරුව ගැඹුරුම ආර්ථික සහ මූල්‍ය අර්බුදයේ පුපුරා යාම, ලෝක වෙලඳ පොල කෙරෙහිවන තරගය යලි වතාවක් එකිනෙකා සියල්ලන්ට එරෙහි වන භයංකර ගැටුමක් බවට පරිවර්තනය වීමේ කොන්දේසි නිර්මානය කරමින් තිබේ.

නව බලවතුන්ගේ නැගී ඒමත් පැරැනි බලවතුන් යලි අවධිවීමත් සමඟ එකතුව, ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ගැඹුරු අර්බුදය සහ තමන්ගේ නැතිවූ ආර්ථික ශක්තිය පරයාලීමට වඩ වඩාත් මිලිටරි උපායන්වල පිහිට සෙවීමට පෙලඹීම පසුගිය ලෝක යුද්ධයට ද වඩා භයංකර තවත් අධිරාජ්‍යවාදී ගැටුමකට කොන්දේසි නිර්මානය කරමින් තිබේ.

අතීත පාඩම්වලින් උගත යුතුය. ධනේශ්වර ලාභ පද්ධතිය පෙරලා දමා සවිඥානිකව හා ප්‍රජාතාන්ත්‍රිකව මානව අවශ්‍යතාවන් උදෙසාම නිර්මානය කල සංවිධිත ලෝක සමාජවාදී ආර්ථිකයක් ස්ථාපිත කිරීම මගින්ම පමනක් අධිරාජ්‍යවාදී යුද්ධයේ තර්ජනය සදහටම අවසන් කල හැකිවන්නේය. සමාජවාදී විප්ලවයේ ලෝක පක්ෂය, හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ඉදිරි දර්ශනය වන්නේ මෙයයි.

**නික් බීම්ස් විසිනි.**

© www.wsws.org